


# සන්නස

## අන්තර්ජාලයෙන් කියවන්න

## www.sannasa.net

## දායකත්වය ලබාගෙන සන්නස තැපෑලෙන් ගෙදරටම ගෙන්වා ගන්න

ඔස්ට්‍රේලියාව තුළ වසරක දායකත්වය ඩොලර් 30 කි.

වෙනත් රටවල් සඳහා වසරකට ඔස්ට්‍රේලියානු ඩොලර් 45 කි

සියළුම චෙක්පත්, මුදල් ඇනවුම් **Sannasa News Group** නමට ලියන්න

### දායකත්ව කූපනය

ඔබේ නම. ..........................................................................

ඔබේ ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න) ..........................................................................

..........................................................................

දුරකථන අංකය ..........................................................................

දිනය ........................................

27 පිටෙන්

බයිසිකලයෙන් ය. ඉංග්‍රීසි මහත්තයා මෝටර් සයිකලයෙන් එයි. සොහොනකඩේ ඉස්කෝලෙහාමිනේ එන්නේ පයින් ය.

ලොකු මහත්මයා ළමයින්ට වැඩිය ගහන්නේ ද නැත. නො ගහනනේ ද නැත. ලොකු මහත්මයා ළමයකුට වේවැල් පහර දෙන සද්දය මුළු ඉස්කෝලයට ම ඇසෙයි.

පංතියේ ටිකක් වැඩ පුලුවන් හොඳ ළමයෙක් ය මා. මගෙන් ''කොප්ප'' ගහන්න ඕනැ තරම් අය සිටිති. එය මට හරි ආඩම්බරයක් ය. ඉස්කෝලේ මහත්තයා හෝ ඉස්කෝලේ හාමිනේ ''දන්නවද' කියා අසන හැම එකකට ම මුලින් අත උස්සන්නේ මා ය. අත උස්සනවා පමණක් නොව උස්සාගෙන වේගයෙන් සොලවන්නේ 'මගෙන් අහන්න මගෙන් අහන්න'' යි කියනවා මෙනි. සෑම ගුරුවර ගුරුවරියක් අතේ ම වේවැළක් ඇත. ලොකු ම වේවැළ තිබෙන්නේ ලොකු මහත්මයා අතේය. ලොකු මහත්මයා අතේ වේවැළ නැත්තම් හරියට නිල ඇඳුමක කොටසක් අඩුවුණා වගේ ය. ලොකු මහත්මයා ගැන සිහිපත් වන හැම විටකම වාගේ මුලින් ම සිහියට එන්නේ වේවැළ ය. මෙම ඉස්කෝලේ කාලවේලා වෙන්කොට තිබුණේ පටන් ගන්නා වේලාව, විවේක වේලාව සහ ඉස්කෝලේ ඇරෙන වේලාව වශයෙනි. විවේක කාලයට ද නියමිත වේලාවක් නැත. ඒ වේලාව බොහෝවිට ලොකු මහත්මයාට හිතුණු වේලාවක් ය. ලොකු මහත්තයාට ඉක්මනින් තේ බොන්න ඕනෑ වුණොත් සාක්කුවේ නළාව කටට ළඟාවෙයි. ඒ නළාව පිම්බාට පසු ඉස්කෝලේ එකම ගාලගෝට්ටයකි.

මේ කියන දවස්වල ඉස්කෝලෙන් කෑමට කිසිවක් දුන්නේ නැත. බනිස් දීමට පටන් ගත්තේ ද ඊට අවුරුදු දෙකකට පමණ පසුව ය. විවේක වේලාවේදී බොහෝදෙනෙක් බො-න්නේ ඇල් වතුරය. එහෙමත් කෙනෙක් තේ වතුර බොයි. අහම්බෙන් දවසක කවුරු හරි මොනවා හෝ අමතර කෑමක් කයි. එදාට ඔහු හෝ ඇය සුවිශේෂ අයෙකි. සමහරක්දාට ආතා මට විස්කිරිඤ්ඤදා දෙකක් හෝ බනිස් ගෙඩියක් ඉස්කෝලෙට ගෙනැවිත් දෙයි.

ඉස්කෝලේ ඇරෙන්න නළාව පිම්බාට පසු ''යෝවද තම්පව රෝමනු ජේසු'' කියන අප ඉස්කෝලෙ වත්තෙන් පාරට පැන ගෙදර දුවන්නේ බත් පංගුව බලාගෙන ය.

මතු සම්බන්ධයි







